**ශ්‍රී ලංකා විවෘතවිශ්වවිද්‍යාලය**

**මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය**

**නීති අධ්‍යයන දෙපාර්තමේන්තුව**

**නීතිවේදී උපාධි පාඨමාලාව- 03 වන මට්ටම**

**අවසාන පරීක්ෂණය - 2020/2021(මාර්ගගත)**

**සාධාරණත්වය පිළිබඳ මූලධර්ම- LLU3502/LWU1202**

**කාලය පැය තුන (03) යි.**

---

**දිනය: 2021 සැප්තැම්බර් 15** **වේලාව: ප.ව. 01.00- ප.ව.04.00**

---

**මුළු ප්‍රශ්න ගණන - 06**

**I කොටසින් ප්‍රශ්න <u>එකක්</u> හා II කොටසින් ප්‍රශ්න <u>තුනක්</u> ද ඇතුළුව ප්‍රශ්න හතරකට (04) පමණක් පිළිතුරු සපයන්න.**

**විභාග අපේක්ෂකයන්ගේ අපැහැදිලි අත් අකුරු සඳහා ලකුණු අඩු කරනු ලැබේ.**

**<u>I කොටස - සාධාරණත්වය පිළිබඳ මූලධර්ම</u>**

**<u>මෙම කොටසින් එක් ප්‍රශ්නයකට (01) පමණක් පිළිතුරු සපයන්න.</u>**

01. පොදු නීතිය සහ සාධාරණත්වය යන දෙකම පරිපාලනය කිරීම සඳහා උසාවි එක් ශ්‍රේෂ්ඨාධිකරණයක් බවට ඒකාබද්ධ කිරීම සඳහා 1873 සහ 1875 අධිකරණ පනත් හඳුන්වා දෙන ලදී. එතැන් සිට පොදු නීතිය හා සාධාරණත්වය සංයෝජනය වීම පිළිබඳ මතභේද වර්ධනය වී තිබේ.

    අධිකරණ පනත් හඳුන්වා දීමට පෙර සහ පසුව ඉංග්‍රීසි නීතියේ සාධාරණත්වය වර්ධනය වීම සම්බන්ධයෙන් සාකච්ඡා කරන්න.

(ලකුණු 25)

02. අ) සාධාරණත්වයේ ආප්ත, සාධාරණත්වය වර්ධනය කිරීමේදී සැලකිය යුතු බලපෑමක් ඇති කරයි. පහත සඳහන් නඩු තීරණ සැලකිල්ලට ගෙන ඉහත ප්‍රකාශය විවේචනාත්මකව අගයන්න:

(i) *ජොන්ස් එ. මේනාර්ඩ්* (*Jones v. Maynard*) 1951 Ch. 672

(ii) *ඕවර්ටන් එ. බැනිස්ටර්* (*Overton v. Banister)* 1844 3 Hare 503

(iii) *පෙන් එ. බැල්ටිමෝර් සාමිවරයා* (*Penn v. Lord Baltimore)* 1750 1 Ves. Sen. 444

(ලකුණු 05×03= 15)

ආ) වර්තමානයේ, සාධාරණත්ව ආප්ත වල ඇති වැදගත්කම පැහැදිලි කරන්න.

(ලකුණු 10)

**<u>II කොටස - භාර නීතිය</u>**

**<u>මෙම කොටසින් ප්‍රශ්න තුනකට (03) පමණක් පිළිතුරු සපයන්න.</u>**

03. අ) ප්‍රතිපාදනය රඳවා තබා ගැනීම සාධාරණීකරණය කළ නොහැකි හෙයින් භාර ආඥාපනතේ 2 වන වගන්තිය අහෝසි කිරීමට කමිටුවක් නිර්දේශ කර ඇත.

මෙම නිර්දේශය සමඟ ඔබ එකඟ වන්නේද?

ඔබේ පිළිතුර සඳහා හේතු දක්වන්න. අදාළ ව්‍යවස්ථාපිත විධිවිධාන සහ නඩු නීතිය උපුටා දක්වමින් ඔබේ පිළිතුර තහවුරු කරන්න.

(ලකුණු 18)

ආ) පරම්පරාගත දේපල, පරම්පරාවෙන් පරම්පරාවට ලබා දීමට සමන්ට අවශ්‍ය වේ. ඒ අනුව එම දේපල පරම්පරාවෙන් පරම්පරාවට හිමිවෙන පරිදි ඔහු විසින් භාරයක් ඇති කරනු ලබයි.

වලංගු භාරයක් සමන් විසින් නිර්මාණය කර ඇත්දැයි සාකච්ඡා කරන්න.

(ලකුණු 07)

04. පහත සඳහන් අවස්ථා වලදී අනුමිත භාර නිර්මාණය වන්නේද යන්න අදාළ ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන සහ නඩු නීතිය අනුව සාකච්ඡා කරන්න.

අ) නියමිත කාලයට ණය ගෙවීමට අපොහොසත් වීම හේතුවෙන් 'තුරුණු තරු බැංකුව කවිඳුට එරෙහිව නඩු පවරන ලදී. නඩුව අධිකරණයේ විභාග වෙමින් තිබියදී, කවිඳු විසින් දොම්පේ රබර් වත්තක් මිලදී ගෙන එය ඔහුගේ සහෝදරිය වන කවිෂාගේ නමින් ලියාපදිංචි කළේය. නඩුව අවසන් වූ පසු එම රබර්

වත්ත නැවත මාරු කරන බවට කවිඳු සහ කවිෂා අතර එකඟතාවක් පැවතුණි. කෙසේ වෙතත්, නඩුව අතරතුර කවිඳු ගෙවීම් පියවා දැමූ අතර බැංකුව විසින් නඩුව ඉල්ලා අස් කර ගන්නා ලදී. කවිඳුට රබර් වත්ත නැවත පැවරීම කවිෂා ප්‍රතික්ෂේප කරයි.

(ලකුණු 12.5)

ආ) නීතා සහ මධූකා බියගම ප්‍රදේශයේ ව්‍යාපාරික හවුල්කරුවන් ය. නීතාට තමන්ගේම ව්‍යාපාර ගණනාවක් ඇති අතර ඇය ඇගේ පෞද්ගලික ව්‍යාපාර සමඟ කාර්යබහුල වී සිටී. එම නිසා, නීතා හවුල් ව්‍යාපාරයේ කළමනාකරණය සහ එහි මූල්‍ය කටයුතු මධූකාට බලා ගැනීමට සලස්වනු ලබයි. මධූකා, නීතාට නොදන්වා මධූකාගේ නමින් හෝටලයක් මිලදී ගැනීමට හවුල්කාරිත්වයේ මුදල් භාවිතා කළාය. මෙම මිලදී ගැනීම ගැන නීතා දැනගත් අතර හෝටලය හවුල් ව්‍යාපාරයේ නාමයට මාරු කරන ලෙස මධූකාගෙන් ඉල්ලා සිටී.

(ලකුණු 12.5)

05. මිහිරිගේ අන්තිම කැමති පත්‍රයේ පහත දැක්වෙන දායාද කිරීම් තුළින් වලංගු පුණ්‍ය භාර නිර්මාණය වේ දැයි භාර ආඥා පනතේ අදාළ ප්‍රතිපාදන සහ විනිශ්චිත තීන්දු ඇසුරෙන් සාකච්ඡා කරන්න:

අ) මන්නාරමේ ධීවර කටයුතුවල නියැලෙන ධීවරයින්ගේ ප්‍රයෝජනය සඳහා මන්නාරම වෙරළ තීරයේ විවේක කාමර සහ ගබඩා කාමර නඩත්තු කිරීම සඳහා මන්නාරම ධීවර සමූපකාර සමිතියට රුපියල් මිලියන 02 ක්:

ආ) පාසල් සිසුන් අතර මානව හිමිකම් පිළිබඳ දැනුවත් කිරීම හා ප්‍රවර්ධනය කිරීම සඳහා මානව හිමිකම් අධ්‍යයන කවයක් පිහිටුවීමට නීතිඥ සංගමයට රුපියල් මිලියන 02 ක්:

ඇ) වීදි සුනඛයින් වෙනුවෙන් කූඩු තැනීම සඳහා 'සත්ව හිමිකම් සමිතියට රුපියල් 50,000 ක්:

ඈ) උපාධි අපේක්ෂකයින්ගේ ප්‍රයෝජනය සඳහා භාවනා පන්ති පැවැත්වීම සහ සෑම වසරකම දෙපාර්තමේන්තුවේ වාර්ෂික දානමය පිංකම පැවැත්වීම සඳහා නීති අධ්‍යන දෙපාර්තමේන්තුවට රුපියල් මිලියන 03 ක්:

ඉ) මාගේ ගමේ මිනිසුන්ගේ උපන්දිනයට තෑගි බෙදා දීම සඳහා මගේ සැමියා වන රනිල්ට රුපියල් මිලියන 04 ක්:

(ලකුණු 05×05 = 25)

06. රුවන් ධනවත් ව්‍යවසායකයෙක් විය. ඔහු තම අන්තිම කැමති පත්‍රය අනුව ඔහුගේ පුතුන් දෙදෙනා වූ විහඟ සහ මංජුලගේ ප්‍රයෝජනය සඳහා භාරයක් යටතේ තේ වත්තක්, සුඛෝපභෝගී හෝටලයක් සහ ඉතිරි කිරීමේ තැන්පතු ගිණුමේ රුපියල් මිලියන 50 ක් දායාද කළේය. භාරකරු වශයෙන් ඔහුගේ මිතුරියක වූ සචිනි පත් කෙරිණි. රුවන්ගේ මරණයෙන් පසු, සචිනි තම මිතුරෙකු වූ සරත්ට සුඛෝපභෝගී හෝටලය වසර 05කට බදු දෙනු ලැබූ අතර බදු කුලිය පෞද්ගලික භාවිතය සඳහා තම පෞද්ගලික බැංකු ගිණුමේ තැන්පත් කරන ලෙස ඉල්ලා සිටියේය. තේ වත්තේ ආදායමෙන් 60% ක් රුවන්ගේ පුතුන් අතර සමානව බෙදූ ඇය භාරකාරනිය ලෙස ඇයගේ සේවාවන් සඳහා වූ වැටුප ලෙස ඉතිරි මුදල රඳවා ගත්තාය. වයස් පූර්ණත්වයට පත්ව ඇති බව පවසා විහඟ විසින් රුවන්ගේ ඉතුරුම් තැන්පතුවෙන් තමන්ගේ කොටස ඉල්ලා සිටියේය. මංජුල තවම බාලවයස්කරුවෙකු බව පසමින් සචිනි එම ඉල්ලීම ප්‍රතික්ෂේප කළාය.

තවදුරටත් රුවන්ගේ දේපල වල ගිණුම් පරීක්ෂා කිරීමට තමාට අවසර දෙන මෙන් විහඟ කළ ඉල්ලීම ද සචිනි ප්‍රතික්ෂේප කළාය. සචිනි, තේ වත්තේ පර්චස් 25 ක කොටසක් ඇගේ මිතුරා වූ විමල්ට විකුණා එම මුදල් ඇගේ පුද්ගලික ප්‍රයෝජනය සඳහා ඇගේ පෞද්ගලික බැංකු ගිණුමේ තැන්පත් කළාය. වසර කිහිපයකට පසු, රුවන්ගේ ඉතුරුම් තැන්පතු ගිණුමෙන් රුපියල් මිලියන 10 ක් භාවිතා කරමින් සචිනි ඇඟලුම් කම්හලක් විවෘත කළාය.

ඉහත සන්දර්භය තුළ ඇති ගැටලු අනුව, පාර්ශවයන්ගේ අයිතිවාසිකම්, යුතුකම් සහ වගකීම් සාකච්ඡා කරන්න. භාර ආඥා පනතේ අදාළ වගන්ති උපුටා දක්වමින් ඔබේ පිළිතුර තහවුරු කරන්න.

(ලකුණු 25)

**--නිමිකම් ඇවිරිණි--**